සෙර්ගේයි බරුස්දින්

අමාරු රාජකාරිය



ප්‍රගති පොතක්

සේර්ගේයි බරුස්ද්‍රින්

අමාරු රාජකාරිය

චිත්‍ර

වයි. බගරෝද්ස්කි

පරිවර්තනය

රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

අමාරු රාජකාරිය
සෙර්ගෙයි බරුස්දින්

චිත්‍ර
බගරෝද්ස්කි

පරිවර්තනය
රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

ISBN 955-1319-05-2

මුද්‍රණය
Kanol PRINT

ප්‍රකාශනය
සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, අමරාරාම අස්. ඇසී. පෙරේරා මාවත, කොළඹ 08

2012 අගෝස්තු

තෝප්කාගේ පිළිරුව

එකමත් එක් ප්‍රදර්ශනයකදි මම දැක්කා අමුතුම තාලේ පිළිරුවක්. ඒ තමයි, ලියෙන් කපපු, බල්ලෙකුගේ හිසක්. ඒක විනෝදජනක සැබෑ බල්ලෙක් වගේ ම පිළිරුවක්. පහළට එල්ලෙන ලොකු කන් පෙති, පිරුණු ලොම්වලින් වැසුණු හොම්බ, පොඩි කපටි ගතියක් තියෙන පුංචි ඇස්, යන්තම් ඇරුණු කටින් සිනහ උපදවන විදිහට එළියට වැටෙන දිව එහෙම මේ පිළිරුවේ යසට කැටයම් කරලා තිබුණා.

මේ පිළිරුවට යටින් ඒකේ නමත් සහටන් කරලා තිබුණා. 'තෝප්කා'.

මා විමසිල්ලෙන් බල්ලාගේ හිස විපරම් කර බැලුවා. එතකොට එකපාරට ම මා දැක්කා උගේ හොම්බ කවුරු හෝ සපා කා තිබෙන බව. ලීයේ දත් පාරවල් සටහන් වෙලා තිබුණා. කනේ අග කැඩිලා, ආපසු අලවලා තිබෙන බව පෙනෙන්නට තිබුණා.

"හිත් ගන්න වැඩක්" මම කල්පනා කළා. "ලී බල්ලෙකුව සපා කන්න පුළුවන් කාට ද?"

අහම්බෙන් සිදු වූ හමුවීමක් නොවෙයි නම් මට ඒ ගැන බාග වෙලාවට එහෙම පිටින් ම අමතක වෙලා යන්න ඉඩ තිබුණා.

මේ ළඟක දී මම පාර්ක් ඇවිදගෙන යනකොට, දැකල පුරුදු බල්ලෙකු අරගෙන යන මහත්මයෙකු මට මුණ ගැසුණා.

"සමාවෙන්න මහත්මයා ඔයාගෙ මේ බල්ලගෙ නම තෝප්කා ද?" කියලා මා ඇසුවා.

"ඔව්, ඔව්, තෝප්කා තමයි" කියලා මේ අමුත්තා මට පිළිතුරු දුන්නා. "සමහර විට මේ මහත්මයා මුගේ පිළිරුව දකින්න ඇති ප්‍රදර්ශනයෙදි එහෙම ද?"

ඇත්ත ම තෝප්කා එයාගේ ලී පිළිරුව වගේ ම තමයි. ඇත්ත තෝප්කාගේ මිටි කකුල්, උගේ ලොම් පිරුණු කොට වලිගෙ එහෙම දැක්කම මට කිසි අමුත්තක් දැනුනේ නෑ. මම හිතුවෙත් ඇත්ත තෝප්කා මේ වගේ ම වෙන්න ඇති කියලයි.



ඒ බව මම තෝප්කා කැටුව ආ මහත්මයාට කීවාම එයා ගොඩක් සතුටු වූ බව පෙනුණා.

"ඔය මහත්මයාගේ ඒ කතාවට මට හරිම සතුටක් ඇති වුණා. ඒ කියන්නේ මගේ නිර්මාණය සාර්ථක වෙලා තියෙනවා" කියලා ඔහු කීවා. ඒත් එක්ක ම හරි සතුටින් ඔහු මෙහෙමත් කිව්වා.

"මේ තෝප්කා, එයත් තමන්ට තේරෙන විදිහට මගේ නිර්මාණ අගය කරලා තියෙනවා...."

"තමන්ට තේරෙන විදිහට කියන්නේ?" කිසිවක් නොතේරුණු මා විමසා සිටියා.

"ඒ මෙන්න මෙහෙමයි. පිළිරුව නෙළුවට පස්සේ මම ටිකක් ඈතට ගියා ඒ දිහා ටික වේලාවක් බලා ඉන්න කියලා හිතාගෙන. මේ නොහොඹිනා බල්ලා, තෝප්කා මෙන්න තමන්ගේ ම පිළිරුවට පැනලා හපාගෙන මගේ මුළු වැඩ මඩුව පුරා ම දුවන්න පටන් ගත්තේ නැතෑ. ගොරවනවා, බුරනවා, මොන විදිහකටවත් මේ පිළිරුව අතහරින්න ලෑස්තියක් නෑ. මුළු පිළිරුව ම සපා කෑවා. වම් කනේ කෙළවර කඩා දැම්මා. පස්සේ ඔක්කොම ආපසු හරිගස්සන්නත්, කන අලවන්නත් සිදු වුණා."

අපි කතා බහ කරන අතරේ තෝප්කා එක ඇහැක් පුංචි කරලා අප දිහා බලාගෙන හිටියා. බල්ලා සෑහෙන්න කලබල ගතියෙන් සිටින බවක් පෙනුණා. ඒ හරියට ම මෙන්න මෙහෙම කියන්නා වාගේ. "හරි මෝඩ වැඩක්නෙ වුණේ, තමන් තමන්ව ම හපා කෑවා."

අලියාගේ මතකය



දැන් මම ඔයාලට පෙන්වන්න යන්නේ ඡන්ගෝව. එයාට වයස අවුරුදු හතළිහක්. අවුරුදු විස්සක් ම ඡන්ගෝ ගත කළේ අපේ සත්තු වත්තේ. මහ යුද්ධය පැවති කාලයේ විතරක් ඡන්ගෝ ව සත්තු වත්තෙන් ඉවත් කරලා ආරක්ෂාව ඇති තැනකට රැගෙන ගොස් තිබුණා. ඉන් පසුව ආපසු සත්තු වත්තට අරගෙන ආවා. ඡන්ගෝ හරි ම නුවණක්කාර අලියෙක්...

සත්තු වත්තේ ප්‍රධානියා ඉවාන් අකීමොවිච් දොර විවර කර දුන්නා. අපි ශීත කුටි පිහිටි කොටසින් ගිම්හාන භූමියට ඇවිත් ඡන්ගෝ හිටපු මහා කූඩුවේ වැටෙනුත් ඇතුළට ආවා.

ඒක ඇතුළෙ තිබුණු ජලාශය ළඟ හිටගෙන හිටි මේ විශාල අලියා වැටේ ඔලුව අතුල්ලමින් හිටියා.

අපි කතා කරන හඬ ඇසුණු ෂන්ගෝ ඔලුව අපි හිටිය පැත්තට හරවලා හොඬයේ අගින් පොළොවට තට්ටු කරන්නට වුණා. අලියාගේ වයසට ගිය විශාල කන් අප දෙසට යොමු වුණා. දෙකට බෙදුණු අගින් යුත් අලියාගේ වලිගය ඒ අතටත් මේ අතටත් පැද්දුණා. ෂන්ගෝ වැරෙන් හුස්ම ගත්තා. අලියා කිසියම් දෙයක් නිසා අසතුටෙන් සිටින බව පෙනෙන්නට තිබුණා.



"නෑ ඔයාලා බය නැතුව ෂන්ගෝ ළඟට යන්න" කියලා දොර ළඟ නතර වූ ඉවාන් අකීමොවිච් අපට කිව්වා. "ෂන්ගෝ මටයි ඔය පුප්පන්නේ..."

"එතකොට ඔබ ඇතුළට එන්නේ නැද්ද?"

"මට කිට්ටු වෙන්නවත් බෑ, ෂන්ගෝ මාව මරලා දාවි" සත්තු වත්තේ ප්‍රධානියා කියා සිටියා.

ඒ කතාවට මට පුදුම හිතුණා.

"තමන්ව බලා කියා ගන්න සත්තු වත්තේ පාලකයාවත් මේ ෂන්ගෝ මරා දමනවා නම් මට මොනවා නොකරාවිද" කියලා මට කල්පනා වුණා.

කොහොම වුනත් මගේ හිතට බයක් ඇති වුණු බව කවුරු හරි දැනගන්න එක වසන් කරන්නත් මට ඕනෑ වුණා. මම අලියා ළඟට ගිහින් උෆට ඇපල් ගෙඩියක් දික්කළා. ෂන්ගෝ බොහෝම පරෙස්සමට හොඬයෙන් ඇපල් ගෙඩිය අරගෙන කට ඇතුළට දා ගත්තා.

මම සාක්කු අතපත ගාලා බැලුවා. ඒත් කුඩා කාසි දෙක තුනක් ඇරෙන්න වෙන මොනවත් සොයා ගන්න තිබුණේ නෑ. කාසි ටික ආපසු සාක්කුවේ හංගා ගන්නටත් කලියෙන් ෂන්ගෝ මගේ අත්ලට හොඬය දිගු කළා.

"නෑ, නෑ. කාසි නම් උඹට දෙන්නේ නෑ. ඉතින් ටිකක් පස්සට පලයන්කෝ" කියලා මම කිව්වා.

හරියට මා කී දේ තේරුම් ගත්තා වාගේ ෂන්ගෝ හිස වනලා පොඩියක් පැත්තකට ගියා, ගිහින් බිම වැල්ලේ හොඬය එහාට මෙහාට හරව හරවා මොනවදෝ පෙන්වන්නට වුණා. දිස්නෙ දෙන බොත්තම් ගොඩකුත් එතැන බිම තිබුණා.

"ෂන්ගෝත් එක්ක දඟකාරකම් කරන ළමයි තමයි ඌට ඔය වැඩේ පුරුදු කරලා තියෙන්නේ" කියලා පස්සේ ඉවාන් අකීමොවිච් මට කරුණු පැහැදිලි කරලා දුන්නා. "සත්තු වත්තට ඉතින් හොඳ අයත්, නරක අයත් කියන හැමෝ ම එනවනේ. ඉතින් නරක පුරුදු කියා දෙන අයත් ඉන්නවා. ඒ අය බොත්තම්, කාසි එහෙම ෂන්ගෝට විසි කරනවා. ඒත් ෂන්ගෝ මෝඩයෙක් නෙවෙයි. ඌ ඒවා ඔක්කෝම එකතු කරනවා. අපි කියලා තියෙන්නේ ෂන්ගෝට මේවා විසි කරන්න එපායි කියලා"

"ෂන්ගෝ ඔබට ඔය තරමට ම අකමැති මොකද?" ඒ ගැන දැන ගන්න මට ඉවසුමක් නැතිවයි හිටියේ.



"ඒක මහ දිග කතාවක්" කියලා ඉවාන් අකීමොවිච් කතාව පටන් ගත්තා. "අපේ සත්තු වත්තට ෂන්ගෝ ව ගේන කොට ඌ හොඳ තරුණයි. හැබැයි හීලෑ නෑ. ගෙනා පළමු දවසෙ ම රෑ ඌ අලි ගාලේ දොර කඩාගෙන එළියට පැන ගත්තා. ඊට පස්සේ සත්තු වත්තේ ගේට්ටුවත් බිඳගෙන පාරවල් දිගේ දුවන්න පටන් ගත්තා. එදා සත්තු වත්තේ රෑ වැඩ මුරය භාරව හිටියේ මම.



අපි අලියා පස්සේ එළවන්න පටන් ගත්තා. අග හෙල්ලයක් වගේ උල් යකඩ පොල්ලක් මගේ අතට අසු වුණා. ළඟ ම හිටි අස්සයා පිට නැඟිලා මම අලියා පසුපස එළවාගෙන ගියා. හැබෑවට ම මං හොඳ හැටියට බය වුණා. මොකද මහ නගරයක පාරවල් දිගේ දුවන කුපිත වුණු වල් අලියකුගෙන් මොන විපතක් වෙයි ද කියලා හිතා ගන්නවත් බැරි නිසා. මම ඔන්ගෝට කිව්වු වෙනකොට අපි නගරේ මැදට ම ඇවිල්ලා.

ඒ වෙනකොට ගිනි නිවන හමුදාවත්, පොලීසියත් අලියා පසු පස එළවනවා. මම අතේ තිබුණු යකඩ පොල්ලෙන් අලියාට දමා ගැසුවා. ඒක අලියාගේ කකුලට වැදුණා. කකුල පැටලිලා ඔන්ගෝ බිම ඇද වැටුණා. පස්සේ ආයෙත් නැගිටලා, බයට ම ළඟ තිබුණු ගෙවල් පේළියක ගේට්ටුව දිහාවට දුවන්න පටන් ගත්තා. ඒ වෙලාවෙ අපි හැමෝ ම එකතු වෙලා අලියව ගැට ගැහැව්වා.

ගැට ගහලා ආපසු සත්තු වත්තට අරගෙන ආවා. කකුලේ තුවාලය පිරිසිදු කරලා බෙහෙත් දැම්මා. ඇත්තෙන් ම ඌට ලොකු තුවාලයක් වෙලා තිබුණේ නෑ. ඒත් හිතාගන්නත් බෑ, ඒක සිදු වෙලා දැන් අවුරුදු විස්සක් ගතවෙලා. ෂන්ගෝ සත්තු වත්තටත්, බලන්න එන අයටත් හුරු වෙලා. කිසි වරදක් කියන්න නෑ. බොහොම කරුණාවන්ත අලියෙක්. කවදාවත් කිසිම කෙනෙකුගේ හිත රිද්දලා නෑ. ඒ වුණාට මට අහලකටවත් කිට්ටු වෙන්න දෙනේනේ නෑ. එක දවසක් මම ටිකකට ෂන්ගෝ ළඟට ගියා. ඊට පස්සේ සෑහෙන කාලයක් මට වෙඳ ගෙදර ඉන්න වුණා. ඒ තරමට ෂන්ගෝ මාව 'හුරතල්' කළා. ඒ කියන්නේ ඌට තාම මතකයි මම කවදා හරි දවසක ඌට නපුරක් කරපු බව. ඒ කියන්නේ "අලියගෙ මතකය නරක නෑ හොඳේ!"

අමාරු රාජකාරිය

මහ යුද්දෙ කාලේ මට හිටියා හොඳ යාළුවෙක්. අපි කොළොප්පමට එයාට කිව්වේ සත්තු වෙදා කියලා. ඒ මොකද දන්නව ද? එයා ඉගෙන ගත්තේ සත්ත්ව පාලකයෙකු වෙන්න නිසා. කලින් එයා සත්ත්ව ගොවිපලකත් වැඩ කරලා තිබුණා. යුද පෙරමුණේදි එයා අපේ කාලතුවක්කු සේනාංකයේ ඔත්තුකාරයෙක් හැටියට සේවය කළා. තමා යුද හමුදාවේ කරන සේවය ගැන අපේ සත්තු වෙදා හරියට ආඩම්බර වුණා. එහෙම ආඩම්බර වෙන්නත් ඔහුට අයිතියක් තිබුණා. මොකද එයා නිර්භීත, දක්ෂ රහස් ඔත්තුකරුවෙක් වුණු නිසා.



තමා හමුවීමට එන්නැයි කියලා හිටි අඩියෙ ම අපේ සත්තු වෙදාට සේනාංක ප්‍රධානියා පණිවිඩයක් එවූ වෙලාවෙ අපි හිටියෙ ජර්මනියේ විශාල නගරයක ඈත කෙළවරක.

"ඔබ යුද්දෙට කලින් සත්ත්ව පාලකයකු වෙන්න ඉගෙන ගත්තා නේ ද?" කියලා ගිය ගමන් ම සේනාංක ප්‍රධානියා ඇහුවා.

"එසේය තුමනි!"

"සත්ත්ව ගොවිපලක වැඩකරලත් තියෙනවා නේ ද?"

"එසේය තුමනි, සේබල් මුගටිත්, රිදී පාට හිවල්ලුත් ලොම් අරගන්න ඇති දැඩි කෙරුවා."

"බොහොම හොඳයි" සේනාංක ප්‍රධානියා කීවා. "මගේ වාහනය අරගෙන වහා ම නගර පාලකතුමා වෙත යන්න. ඔබ එනතුරු ඔහු බලාගෙන ඉන්නවා."

කිසි දෙයක් දැනගෙන හිටියේ නැති අපේ සත්තු වෙදා මෙහෙම ඇසුවා. "මා එහි යා යුත්තේ ඇයි ද කියා දැන ගැනීමට අවසර ද මේජර් තුමනි?"

"එහෙදි දැනගන්න පුළුවන්. ඉක්මන් කරන්න!" කියලා හිනාව හිර කරගෙන මේජර් තැන කිව්වා.

නගර පාලක හැටියට කටයුතු කළ තරුණ ලුතිනන් කර්නල් තැන වෙත අපේ සත්තු වෙදා පැමිණියා.

නගර පාලකවරයාත් කලින් අහපු ප්‍රශ්න ම ආපසු විමසලා පස්සේ මෙහෙම කිව්වා.

"බොහොම හොඳයි, අමාරු රාජකාරියක් තියෙනවා පවරන්න. වහා ම සත්තු වත්තට ගිහිල්ලා ඒකෙ පාලනය තමන්ගේ අතට ගන්න. සත්තු වත්තේ පාලකයා හැටියට ඔබ පත් කිරීමේ නියෝගයට මා දැන් අත්සන් තබනවා. ඔබගේ යටතට මා හට කණ්ඩායමක් ලබා දෙනවා.

සතුන්ට වුවමනා කෑම සපයා ගන්න ඕනෑ. එකෙක් නෑර හැම සතෙකුට ම හොඳට කන්න දෙන්න ඕනෑ. උන් එතැන දැන් බඩගින්නේ කෑ හගනවා. ජර්මන්කාරයෝ උන්ට දැන් දවස් හතරකින් කන්න දීලා නෑ. තව එකක් තියෙනවා. ඒක තමයි අමාරු ම. එතැන ඉන්නවා හිපපොටේමස් කෙනෙක්. බෝම්බ කෑල්ලක් වැදිලා උගේ පිට කොන්ද තුවාල වෙලා. වහා ම ඒ සතාට බෙහෙත් කරන්න ඕනෑ...."

"මට සමාවෙන්න!" කියලා අපේ සත්තු වෙදා පිංසෙණ්ඩු වෙන්න පටන් ගත්තා. "මම වැඩ කළේ සත්ත්ව පාලකයෙක් හැටියට. හිවල්ලුන්ගේ වැඩ නම් කරලා තියෙනවා. ඒත් කිසිමදාක...."

"යුද්දෙට කලින් මමත් කිසිම දාක නගර පාලකයෙක් හැටියට වැඩ කරලා තිබුණේ නෑ" කියලා ලුතිනන් කර්නල්වරයා අපේ සත්තු වෙදාගේ කතාවට බාධා කළා. "මම කළේ ඉස්කෝලෙක සංගීතෙ උගන්නපු එක. ඒ වුණාට දැන් මේ දේවල් කරන්න සිද්ද වෙලා තියෙනවා. කරුණාකර ගිහින් නියෝගය ඉටු කරන්න! ප්‍රශ්නයක් ඇති වුනොත් මට කතා කරන්න. එක සතෙක්වත් නැති නොවන විදියට වැඩ කරන්න වග බලා ගන්න!"

ඉතින් කැමති වුණත් නැතත් අපේ සත්තු වෙදාට නියෝගය ඉටු කරන්න සිදුවුණා. ඔහු අලුත් සේවා ස්ථානයට ආවා. ඒක දැකපු සත්තු වෙදා නළලේ අත ගසා ගත්තා. ඒක එතරම් ලොකු සත්තු වත්තක් නොවුණට කට ළඟට පිරෙන්න වැඩ ගොඩ ගැහිලා තිබුණා. කොටියෙක්, වළස්සු දෙන්නෙක්, වඳුරෝ, කුරුල්ලෝ හැම එකෙක් ම කෑම ඉල්ලලා එකෙක් පරයමින් එකෙක් කෑ ග හනවා, ඝෝෂා කරනවා. සත්තු වත්තේ තිබුණු තටාකයේ සීල් මාළු බඩගින්නේ කේන්තියෙන් එහෙ මෙහෙ පීනනවා. බය වෙච්ච පිණිමුවොයි, කඳුරට එළුවොයි සත්තු වත්තේ පොඩි පාරවල් දිගේ දුව ඇවිදිනවා. ඒ මදිවට හිපපොටේමසුත් ඉන්නවා! ඒ අහිංසකයා රැළි නංවමින් වතුරේ පීනනවා, තුවාලයේ වේදනාව නිසා කන් අඩි පැලෙන තරමට බෙරිහන් දෙනවා.

අපේ සත්තු වෙදා රාජකාරි පටන් ගත්තා. පළමුවෙන් ම ඉටු කළේ අමාරු ම රාජකාරිය. හිපපොටේමස්ගේ ඇඟට උඩින් කඹයක් දාලා, වෙළලා, ඌව ගොඩට ඇදලා වැටට හේත්තු කරලා ගැට ගැහැව්වා. දැන් ඉතින් තුවාලෙ පිරිසිදු කරන්නත්, ඒකට අයඩින් වතුර දාන්නත්, ඒ වගේ ම මැහුම් දාන්නත් පුළුවන්.

තුවාලය එතරම් බරපතල එකක් නොවෙයි. හිපපොටේමස්ගේ හමත් හරි ම මහතයිනේ. ඒ නිසා ඉක්මනින් හොඳ වේවි.

සෙබලූ පිරිසක් හිපපොටේමස්ට බෙහෙත් දාන වැඩට හවුල් වෙන අතරේ අනෙක් පිරිස පැනලා ගිය සතුන් අල්ලාගෙන ඇවිල්ලා උන්ට කන්න කෑමත් සොයා ගෙන ආවා.

ටිකෙන් ටික හැන්දෑ වෙන්න පටන් ගත්තා. බඩ පුරවා ගත්ත සත්තුත් ටිකෙන් ටික සන්සුන් වුණා.

අප පිට වී යා යුතු වේලාව පැමිණියා. භාර දුන්න රාජකාරිය හරි හැටි ඉටු කිරීම නිසා සතුටට පත් වුණු අපේ සත්තු වෙදා නගර පාලක තැන හමුවීමට දුවගෙන ගියා.

"ලුතිනන් කර්නල් තුමනි, අපේ කට්ටියත් එක්ක පිටත්ව යන්න මට අවසර ද?" කියලා ඇසුවා.

"නැහැ! ඒ විදිහට මේ වැඩේ කරන්න බැහැ" නගර පාලක තැන කිව්වා. "සතුන්ගේ වැඩ ගැන දන්න කෙනෙක් සොයා ගන්න තරු ඔබ මෙහෙ නතර විය යුතුයි. මා දැනටමත් ඒ ගැන විමසීමක් කර තිබෙනවා. ඔබට පුළුවන් පස්සේ තමන්ගේ කට්ටිය අල්ලා ගන්න."



"ඔබට තේරෙනවද ලුතිනන් කර්නල් තුමනි" අපේ සත්තු වෙදා ආයෙමත් කන්නලව් කරන්න පටන් ගත්තා. "මට හරිම ලැජ්ජයි! මේ හිපෝ හැම වෙලාවෙ ම මගේ පස්සෙන් ම යි, හරියට ඌරු පැටියෙක් වගේ. සෙබලු හිනා වෙනවා. කොහොම වුණත් මම රහස් ඔත්තුකාරයෙක්නේ. ඒත් මෙතන හිපෝ කෙනෙක්...."

"ගණන් ගන්න එපා!" කියලා නගර පාලකයා සිනහසුණා. "ටිකක් ඉවසලා ඉන්න වෙනවා. හොඳයි නියෝගය ඉටු කරන්න."

ඒ නිසා සත්තු වෙදා නැතිව අපට ගමනට පිටත් වෙන්න සිදු වුණා. ඔහු ආයෙත් අපිත් එක්ක එකතු වුණේ එල්බ්‍රෑස් කඳුවැටිය ළඟදි.

ඔහු පළමුවෙන් ම කළේ සේනාංක ප්‍රධානියා වෙත පැමිණීමයි. "මේජර් තුමනි, වාර්තා කිරීමට අවසර! ඔබගේ නියෝගය ඉටු කරන ලදි. සත්තු වත්ත යථා තත්ත්වයට පත් කර තිබේ. මරණ නොමැත. හිපපොටේමස් සනීපයෙනි!"

"ඔබගේ සේවය වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා!" කියලා සේනාංක ප්‍රධානියා කිව්වා.

"මොන ආකාරයෙන් හෝ මාගේ මව්බිමට සේවය කිරීමට ලැබීම සතුටක්!" කියලා අපේ යහළුවා උත්තර දුන්නා.

රුසියානු හා සෝවියට් සාහිත්‍ය සංගමයේ පණිවිඩය...

1991 වසරේ දී සිදු වූ සෝවියට් සංගමයේ බිඳවැටීමෙන් පසු ගත වූ වසර 15 තුළ දී, 'ප්‍රගති' හා 'රාදුගා' යන ප්‍රකාශක සමාගම් දෙක පුම්බ සෝවියට් ආයතන විසින් සිංහල භාෂාවට පරිවර්තනය කොට පළ කරන ලද, රුසියානු - සෝවියට් සාහිත්‍යයේ අනගි නිර්මාණ, අතිශය පිළිකුල් සහගත හා නින්දනීය ආකාරයෙන් අද ශ්‍රී ලංකාවෙහි විකෘති කිරීමට භාජනය වෙමින් පවතී. පරිවර්තකයා ගේ නාමය බැහැර කොට නැවත මුද්‍රණය කිරීම, මුල් පරිවර්තනයෙහි සුළු සංශෝධන කරමින් එකී පරිවර්තන කෘති හා චිත්‍ර, මේ කුට ව්‍යාපාරයෙහි නිරත ජාවාරම්කරුවන් ගේ ස්වතන්ත්‍ර නිර්මාණ ලෙස හුවා දැක්වීම ආදිය ඉන් කිහිපයකි. එපමණකින් නො නැවතුණු ඔවුහු ඒවා රටේ අධ්‍යාපන ශාලයටද එකතු කර හමාර ය. ශ්‍රී ලංකාවේ පරපුරු ගණනාවක ළමා මනස හැඩ ගැස් වූ රුසියානු - සෝවියට් ළමා පොත් කෙරේ මේ තත්ත්වය දැඩි ලෙස බලපා තිබේ.

මේ ව්‍යසනයෙන් රුසියානු - සෝවියට් කෘති මුදවා ගැනීමේ ඒකායන අරමුණින්, දශක පහක කාලයක් පුරා රුසියානු - සෝවියට් සාහිත්‍යය ශ්‍රී ලාංකිකයන්ට, සිංහල පමණක් නො ව දෙමළ හා ඉංග්‍රීසි බසින් ද හඳුන්වා දීමට පුරෝගාමීවූත්, එකී මෙහෙවර උදෙසා අති දැවැන්ත කායික කොටස ඉටුකළා වූත්, සෝවියට් ප්‍රකාශක ආයතනයන්ගේ ශ්‍රී ලංකාවේ එක ම නියෝජිතයා ලෙස කටයුතු කළා වූත්, ඒ මෙහෙය උදෙසා 2005 වසරේ දී සොළඹ රුසියානු සේන්ද්‍රය විසින් ලියෝ තෝල්ස්තෝයි සම්මානයෙන් පුද දෙනු ලැබුවාවූත් සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂින් හවුස් (සී/ස ප්‍රගති ප්‍රකාශක නිවස), සිය පාඨක ජාලය හා එක් ව ''රුසියානු හා සෝවියට් සාහිත්‍ය සංගමය'' පිහිටුවා ගෙන තිබේ.

මේ සංවිධානය සිය මූලික කාර්ය්‍ය ලෙස දකිනුයේ රුසියානු - සෝවියට් මුල් පරිවර්තන කෘති සිසිදු සංශෝධනයකින් හෝ සංස්කරණයකින් හෝ තොරව, මුල් පිටපතේ ගුණාත්මකභාවය හැකිතාක් උපරිම අයුරින් රැකගෙන නැවත පාඨකයා අතට පත් කිරීම යි. එහි දෙවැනි කාර්ය්‍ය වනුයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් මෙතෙක් පළ වී නොමැති කෘති ද, රුසියානු භාෂාව මූලික සෝවියට් සංගමයේ භාවිත භාෂාවලින් හා ඉංග්‍රීසි බසින් ද පරිවර්තනය කර එළි දැක්වීම යි.

මේ සංවිධානය සතුව පවතින මූල්‍ය හා මානව සම්පත් පිළිබඳ ව සලකා බැලීමේ දී, මේ ඉටුකිරීමට සැරසෙනුයේ බැරෑරුම් කාර්යයකි. එහෙයින් මූලික අනුග්‍රහයෙන් මෙන් ම, මේ සංවිධානයේ සාමාජිකත්වය පුළුල් කිරීමට දායක වීමෙන් හා ඔබ සතුව සංරක්ෂණය වී පවතින මුල් පරිවර්තන ග්‍රන්ථවල පිටපත් ලබා දීමෙන් ඔබට ද ලාංකික පාඨකයන් උදෙසා අමිල සේවයක් ඉටු කළ හැක.

ඒ අනුව මින් මතුවට ලකුණ යටතේ 'ප්‍රගති පොතක්' නමින් එළි දකිනුයේ දූෂණය නො වූ, නො සෝදුණු, ගියම මුල් කෘති ය. එ නම් ඔබ ගේ පොත් ය.

වැඩි විස්තර විමසීම සඳහා:

සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂින් හවුස්,
අංක 91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08.
දුරකථන: 011 2669889 ෆැක්ස්: 011 2691610

ISBN 955-1319-05-2

මිල රු. 180/=